(නවවැනි පාර්ලිමේන්තුව - පස්වැනි සභාවාරය)

අංක 1(9).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2024 මැයි 14 අඟහරුවාදා**

---

**2024 මැයි 22 බදාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය,— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වගන්තිය යටතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරාවුර් ප්‍රදේශයේ ස්ථාපිත "විශේෂිත රෙදිපිළි නිෂ්පාදන කලාපය" සම්බන්ධයෙන් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2024 මාර්තු 28 දිනැති අංක 2377/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.05.14 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— ඛනිජතෙල් සම්පත් පනත යටතේ නියෝග,— 2021 අංක 21 දරන ඛනිජතෙල් සම්පත් පනතේ 4(අ) සහ16(4) වගන්ති සමඟ කියවිය යුතු 48 වගන්තිය යටතේ සහ 2021 අංක 21 දරන ඛනිජතෙල් සම්පත් පනතේ 13(3) වගන්තිය සමඟ කියවිය යුතු 48 වගන්තිය යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2024 මාර්තු 05 දිනැති අංක 2374/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.05.13 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**2024 ජූනි 04 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න
**(2024 ජූනි 04 අඟහරුවාදා)**

2094/2024

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නිලවරණයක් පැවැත්වීම සඳහා වෙන්නප්පුව, සිංගක්කුලිය දේවාලයේ මහා සභාව 2024.02.25 දින කැඳවා තිබූ අතර පසුව එම මහා සභාව අවලංගු කර ඇති බව දන්නේද;

(ii) එම මහා සභාව අවලංගු කිරීම සඳහා අධිකරණ නියෝගයක් නිකුත් කර තිබේද;

(iii) එම මහා සභාව අවලංගු කරන ලෙස දන්වා බෞද්ධ කටයුතු කොමසාරිස් හෝ වෙනත් නිලධාරියෙක් ලිපියක් නිකුත් කර තිබේද;

(iv) එසේ නම්, එම ලිපිය ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සාමාජික ගාස්තු අය කර සිංගක්කුලිය දේවාලය සඳහා සාමාජිකයන් බඳවාගෙන ඇති බව දන්නේද;

(ii) මහා සභාව අවලංගු කිරීමට එරෙහිව එම දේවාලයේ සාමාජිකයන් විසින් විරෝධතා ඉදිරිපත් කර තිබේද;

(iii) එසේ නම්, මහා සභාව අවලංගු කිරීම හේතුවෙන් ඉහත දේවාලයේ සාමාජිකයන්ගේ මානව හිමිකම් හා අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බව පිළිගන්නේද;

(iv) එසේ නම්, එය නිවැරදි කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2024 ජූනි 18 අඟහරුවාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3/2024

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා,— වනජීවී හා වනසම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) සෑම වර්ෂයකම අධික වියළි කාළගුණ තත්ත්ව පවතින කාලවලදී මහනුවර, පන්විල සහ උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස බලප්‍රදේශ ඇතුළු මධ්‍යම කඳුකරයේ බොහෝ ප්‍රදේශවල රක්ෂිත වනාන්තර, ජල පෝෂක ප්‍රදේශ ආශ්‍රිත වනාන්තර සහ කුඩා ලඳු කැළෑ ගිනි තබන බවත්;

(ii) ඒ හේතුවෙන් ජල උල්පත් සිඳීයාම, වර්ෂා කාලයට කඳු මුදුන්වල ඇති ගල් පෙරලීම හා නාය යාම් ඇති වීම වැනි හානි සිදු වන බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එවැනි ගිනි තැබීම් වැළැක්වීම සඳහා පියවර ගෙන තිබේද;

(ii) උණුසුම් කාළගුණයත් සමඟ ගිනි ගැනීම් සීඝ්‍රයෙන් පැතිරීම පාලනය කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(iii) සංවේදී පරිසර පද්ධති ආරක්ෂා කිරීම සඳහා තිරසර විසඳුමක් ලබා දෙන්නේද;

(iv) එසේ නම්, එම විසඳුම කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

41/2024

ගරු බුද්ධික පතිරණ මහතා,— අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 1948.02.04 දිනෙන් පසුව මරණ දඬුවම නියම කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකාවේ එල්ලා මරණයට පත් කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එල්ලා මරණයට පත් කරන පුද්ගලයින්ගේ මරණ සහතික ඥාතීන් වෙත ලබා දීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගත වන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) හිටපු අග්‍රාමාත්‍ය ගරු එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා ඝාතනය කිරීම සම්බන්ධයෙන් වැරදිකරු වූ තල්දූවේ සෝමාරාම හිමියන්ගේ මරණ සහතිකය මෙතෙක් නිකුත් කර නොමැති බවත්;

(ii) 1962.07.06 දින තල්දූවේ සෝමරාම හිමි එල්ලා මැරූ බවට සඳහන් වුවද එදිනට එම නමින් මරණයක් ලියාපදිංචි වී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) තල්දූවේ සෝමරාම හිමියන්ගේ මරණ සහතිකය නිකුත් නොකිරීම පිළිබඳ පරීක්ෂණයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එහි නිගමනය කවරේද;

(iii) නොඑසේ නම්, පරීක්ෂණයක් සිදු කරන්නේද;

(iv) මරණ දඬුවම ක්‍රියාත්මක කිරීමෙන් පසු අදාළ මරණ සහතික නිකුත් නොකළ තවත් පුද්ගලයන් සිටීද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

311/2024

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර, කුරුවිට, බෝපත් ඇල්ල නැරඹීමට පැමිණෙන දේශීය හා විදේශීය සංචාරකයන්ගෙන් මුදල් අයකරන්නේද;

(ii) එසේ නම්, එම මුදල් අයකර ගනු ලබන ආයතනය කවරේද;

(iii) ඒ තුළින් එම ආයතනය උපයනු ලබන වාර්ෂික ආදායම කොපමණද;

(iv) එම ආදායම යොදා ගනිමින් බෝපත් ඇල්ල නැරඹීම සඳහා පැමිණෙන සංචාරකයන්ට අවශ්‍ය පහසුකම් සංවර්ධනය කිරීමට පියවර ගෙන තිබේද;

(v) බෝපත් ඇල්ල නැරඹීම සඳහා පැමිණෙන දේශීය ළමා සංචාරකයකුගෙන් හා විදේශීය ළමා සංචාරකයෙකුගෙන් අයකරනු ලබන මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

358/2024

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2023.10.30 දින වනවිට ශ්‍රී ලංකාවේ ආබාධ සහිත පුද්ගලයන් සංඛ්‍යාව, අවුරුදු 5-10, 10-15, 15-20, 20-30, 30-40 සහ 40න් ඉහළ යන එක් එක් වයස් කාණ්ඩය, ස්ත්‍රී පුරුෂ සමාජ භාවය, ආබාධය සහ එක් එක් දිස්ත්‍රික්කය අනුව;

(ii) වයස අවුරුදු 5-20 අතර ආබාධ සහිත අය අතරින් ප්‍රාථමික, ද්වීතියික හා තෘතියික අධ්‍යාපනය ලබන සංඛ්‍යාව සහ අධ්‍යාපනය නොලබන සංඛ්‍යාව ස්ත්‍රී පුරුෂ සමාජ භාවය අනුව;

(iii) වයස අවුරුදු 20න් ඉහළ ආබාධ සහිත පුද්ගලයන් අතරින්, රාජ්‍ය අංශයේ, පෞද්ගලික අංශයේ සහ ස්වයං රැකියා ක්ෂේත්‍රයේ සේවය කරනු ලබන පුද්ගලයන් සංඛ්‍යාව ස්ත්‍රී පුරුෂ සමාජ භාවය අනුව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත (iii)හි සඳහන් සංඛ්‍යාව මුළු ආබාධ සහිත පුද්ගලයන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

368/2024

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2020 දක්වා ශ්‍රී ලංකාවේ ද්විත්ව පුරවැසිභාවය ලබා ගැනීම සඳහා ඉල්ලුම්කර ඇති පුද්ගලයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ අතරින් ද්විත්ව පුරවැසිභාවය ලබා දී ඇති සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ද්විත්ව පුරවැසිභාවය සඳහා ඉල්ලුම් කරන ලද දිනයේ සිට ක්‍රියාවලිය සම්පූර්ණ වීම සඳහා නිශ්චිත කාලයක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

371/2024

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ලසාර්ඩ්-ප්‍රාන්ස් සමාගමෙන් (M/S Lazards-France) මූල්‍ය උපදේශන සේවා ලබා ගැනීමට ශ්‍රී ලංකා රජය ගිවිසුමකට එළැඹී තිබේද;

(ii) එසේ නම්, එම ගිවිසුම අනුව ඉහත සමාගමේ මූලික වගකීම් කවරේද;

(iii) ඉහත ගිවිසුම ප්‍රකාරව ශ්‍රී ලංකා රජය විසින් ගෙවිය යුතු මුදල හා මේ වනවිට ගෙවා ඇති මුදල ශ්‍රී ලංකා රුපියල් හා එක්සත් ජනපද ඩොලර් වලින් වෙන් වෙන් වශයෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ක්ලිෆර්ඩ් චාන්ස් (M/S Clifford Chance LLP) සමාගමෙන් නීති උපදේශක සේවා ලබා ගැනීමට ශ්‍රී ලංකා රජය ගිවිසුමකට එළැඹී තිබේද;

(ii) එසේ නම්, එම ගිවිසුම අනුව ඉහත සමාගමේ මූලික වගකීම් කවරේද;

(iii) ඉහත ගිවිසුම ප්‍රකාරව ශ්‍රී ලංකා රජය විසින් ගෙවිය යුතු මුදල හා මේ වනවිට ගෙවා ඇති මුදල ශ්‍රී ලංකා රුපියල් හා එක්සත් ජනපද ඩොලර් වලින් වෙන් වෙන් වශයෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

380/2024

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ඇණවුම් කරනු ලබන ඉන්ධන තොග, ගොඩබාන ස්ථාන සහ ගොඩබාන ක්‍රමය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) නළ මඟින් ගොඩබාන්නේ නම්, ඒ සඳහා භාවිතා කරනු ලබන නළ සංඛ්‍යාව කොපමණද;

(iii) එම නළ පද්ධතිය අකර්මණ්‍ය හෝ බාධා සහිත නම්, එය නවීකරණය කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කර තිබේද;

(iv) එසේ නම්, ඇස්තමේන්තු මුදල කොපමණද;

(v) නළ පද්ධතියේ දෝෂ පවතින අවස්ථාවකදී ඉන්ධන නැවක් ගොඩබෑම සඳහා ගත වන දින සංඛ්‍යාව හා නළ පද්ධතිය කාර්යක්ෂමව පවතින අවස්ථාවකදී ඉන්ධන නැවක් ගොඩබෑම සඳහා ගත වන දින සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාව විසින් ඇණවුම් කරනු ලබන ඉන්ධන නැව් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉන්ධන නැවක් සඳහා ප්‍රමාද ගාස්තු ලෙස එක් දිනකට ගෙවිය යුතු මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1244/2024

ගරු කුමාරසිරි රත්නායක මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය (CSIAP) නමින් ව්‍යාපෘතියක් මොණරාගල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වන බව දන්නේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, එම එක් එක් කොට්ඨාසයේ එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන කාල සීමාව, කෘෂි ව්‍යාපෘති හා වාරි ව්‍යාපෘති ලෙස එම එක් එක් කොට්ඨාසය සඳහා වෙන් කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත ව්‍යාපෘතිය යටතේ මේ වනවිට ක්‍රියාත්මක කර අවසන් කර ඇති කෘෂි ව්‍යාපෘති වර්ග හා වාරි ව්‍යාපෘති වර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මේ වනවිට ක්‍රියාත්මක වෙමින් පවතින කෘෂි ව්‍යාපෘති වර්ග හා වාරි ව්‍යාපෘති වර්ග, එම එක් එක් ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය සහ එම එක් එක් ව්‍යාපෘතිය අවසන් කිරීමට යෝජිත දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2111/2024

ගරු නීතීඥ රවුෆ් හකීම් මහතා,— මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර සම්බන්ධයෙන් පිළිගත් ප්‍රාථමික අලෙවිකරුවන් 14 දෙනා විසින් 2022.06.30 වන දිනෙන් අවසන් වන කාලය සඳහා උපයාගත් ප්‍රාග්ධන ලාභය;

(ii) ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර සම්බන්ධයෙන් 2023.06.30 වන දිනෙන් අවසන් වන කාලය සඳහා එම අලෙවිකරුවන් විසින් උපයාගත් ප්‍රාග්ධන ලාභය;

(iii) 2022.06.30 වන දිනෙන් අවසන් වන කාලසීමාව සඳහා මෙම අලෙවිකරුවන් විසින් උපයා ඇති මුළු ප්‍රාග්ධන ලාභය;

(iv) 2023.06.30 දිනෙන් අවසන් වන කාලසීමාව සඳහා මෙම අලෙවිකරුවන් විසින් උපයා ඇති මුළු ප්‍රාග්ධන ලාභය;

වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2023.06.30 වන දිනෙන් අවසන් වන කාලසීමාව තුළ මෙම අලෙවිකරුවන් විසින් උපයාගත් ප්‍රාග්ධන ලාභවල සැලකිය යුතු වර්ධනයක් සිදුවී තිබේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

(iii) මෙම අනපේක්ෂිත ලාභය සඳහා මෙම අලෙවිකරුවන් විසින් ගෙවන ලද බදු මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2131/2024

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා බලප්‍රදේශයට අයත් 540-බී ජයතිලක ග්‍රාම නිලධාරි වසමේ පිහිටි විජේසේකර මාවත/පාර යන මාර්ගයට අදාළ ගොඩනැගිලි රේඛා සීමාව, එම මහ නගර සභාවේ වර්ෂ 2007-2020 සංවර්ධන සැලැස්ම අනුව මාර්ගය මධ්‍යයේ සිට අඩි 20ක් ලෙස පැවති නමුත් වර්ෂ 2020 - 2031 සංවර්ධන සැලැස්ම අනුව එම සීමාව අඩි 10ක් ලෙස අඩු කර තිබේද;

(ii) එසේ නම්, වර්ෂ 2020-2031 සංවර්ධන සැලැස්ම අනුව ඉහත මාර්ගයේ ගොඩනැගිලි රේඛා සීමාව මාර්ගය මධ්‍යයේ සිට අඩි 10ක් දක්වා අඩු කිරීමට හේතු කවරේද;

(iii) වර්ෂ 2020-2031 සංවර්ධන සැලැස්ම අනුව දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා බලප්‍රදේශයට අයත් වෙනත් මාර්ගවල ගොඩනැගිලි රේඛා සීමාව, පෙර පරිදිම මාර්ගය මධ්‍යයේ සිට අඩි 20ක් ලෙස පවත්වාගෙන යාමට තීරණය කර තිබේද;

(iv) එසේ නම්, ඉහත මාර්ගයේද ගොඩනැගිලි රේඛා සීමාව, මාර්ගය මධ්‍යයේ සිට අඩි 20 සීමාවේ දිගටම පවත්වාගෙන යාම සඳහා පියවර ගන්නේද;

(v) ඉහත මාර්ගයේ දෙපස සිදු කර ඇති ගොඩනැගිලි ඉදිකිරීම්, නාගරික සංවර්ධන අධිකාරියේ නීති රීතිවලට අනුකූල වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2024 ජුනි 19 බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

466/2024

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බස්නාහිර පළාතේ, එක් එක් පළාත් පාලන ආයතනය විසින් කුණු කසළ බැහැර කරනු ලබන ස්ථාන වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) මේ වනවිට බස්නාහිර පළාතේ විශාල වශයෙන් කුණු කසල එක්රැස් වී ඇති ස්ථාන සංඛ්‍යාව සහ ඒවා පිහිටා ඇති ස්ථාන වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ස්ථාන අවට ජීවත් වන ජනතාවට පාරිසරික ගැටලු රාශියකට මුහුණ දීමට සිදු වී තිබෙන බව දන්නේද;

(iv) එම ගැටලු විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

511/2024

ගරු රෝහණ බංඩාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මැදවච්චිය වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු අවසන් කරන ලද දිනය කවරේද;

(ii) එම වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) එම වෙළඳ සංකීර්ණය කඩිනමින් විවෘත කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

542/2024

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය,— කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ශාඛා සංඛ්‍යාව කොපමණද;

(ii) එම කාර්යාංශය යටතේ පවතින පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iii) එම පුහුණු මධ්‍යස්ථාන විසින් පවත්වනු ලබන පාඨමාලා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2020 සිට මේ දක්වා විදේශ ගත වී ඇති පුහුණු හා නුපුහුණු ශ්‍රමිකයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට පුහුණු /නුපුහුණු ශ්‍රමිකයන් ඉල්ලුම් කර ඇති රටවල් සහ ශ්‍රමිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

565/2024

ගරු සංජීව එදිරිමාන්න මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන එම දෙපාර්තමේන්තුවට අයත් සේවකයන් සංඛ්‍යාව සහ ඒකාබද්ධ සේවයට අයත් සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අයත් විධායක ශ්‍රේණියේ නිලධාරින්ට, විධායක ශ්‍රේණියේ නොවන නිලධාරින්ට සහ කණිෂ්ඨ සේවකයන්ට ගෙවනු ලබන මාසික වැටුප් හා දීමනා එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඒකාබද්ධ සේවයට අයත් විධායක ශ්‍රේණියේ නිලධාරින්ට, විධායක ශ්‍රේණියේ නොවන නිලධාරින්ට සහ කණිෂ්ඨ සේවකයන්ට ගෙවනු ලබන මාසික වැටුප් හා දීමනා එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

590/2024

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට කුරුල්ලන් ආනයනය කිරීම සඳහා අනුමතිය ලබා දී තිබේද;

(ii) එසේ නම්, කුරුල්ලන් ආනයනය කිරීම සඳහා අනුමතිය ලබා දී ඇති රටවල් කවරේද;

(iii) එම අනුමතිය ලබා දීමේදි කුරුළු උණ රෝගයට අදාළ නිර්ණායකයන් සැලකිල්ලට ගෙන තිබේද;

(iv) එම අනුමතිය ලබා දීමේදී සලකා බලන ලද වෙනත් නිර්ණායක කවරේද;

(v) ආනයනය කරනු ලබන කුරුල්ලන්ගෙන් කුරුළු උණ රෝගය ව්‍යාප්ත වීමේ අවදානමක් තිබේ නම්, ඒ සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

611/2024

ගරු ජයන්ත සමරවීර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වත්මන් ජනාධිපතිතුමා, ජනාධිපති ධුරයට පත්වීමෙන් පසු සහභාගී වී ඇති විදේශීය සංචාර කවරේද;

(ii) එම එක් එක් විදේශීය සංචාරයේදී හමු වූ විදේශීය රාජ්‍ය නායකයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම විදේශීය රාජ්‍ය නායකයන් සමඟ රාජ්‍ය තාන්ත්‍රික ගිවිසුම්වලට එළඹුණේද;

(iv) එසේ නම්, ගිවිසුම්වලට එළැඹි කාරණය එක් එක් ගිවිසුම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ඉහත සඳහන් එක් එක් විදේශීය සංචාරයේදී ජනාධිපතිතුමා සමඟ සහභාගි වූ සෙසු නියෝජිත පිරිස වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම එක් එක් විදේශීය සංචාරය සඳහා රජය විසින් වියදම් කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

636/2024

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා,— කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2023 වර්ෂයේදී රජයේ මැදිහත්වීම මත විදේශ රැකියා සඳහා ශ්‍රී ලාංකික සේවකයන් යොමු කර ඇති රටවල් කවරේද;

(ii) එම එක් එක් රට වෙත යොමු කර ඇති සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2023 වර්ෂයේදී රජයේ මැදිහත්වීමකින් තොරව විදේශ රැකියා සඳහා යොමු වී ඇති ශ්‍රී ලාංකික සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම වර්ෂයේදී විදේශීය රැකියාවල නියුතු සේවකයන් විසින් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කර ඇති මුළු විදේශ විනිමය ප්‍රමාණය කොපමණද;

(v) ඉදිරියේදී විදේශීය රැකියා සඳහා ශ්‍රී ලාංකික පුහුණු ශ්‍රමිකයන් යොමු කරවීමට සකස් කර ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1092/2024

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය' මේ වනවිට ක්‍රියාත්මක වන්නේද;

(ii) 'කිරි ගොවිපොළ 1000ක් පිහිටුවීමේ වැඩසටහන' යටතේ මේ වනවිට පිහිටුවා ඇති කිරි ගොවිපොළ සංඛ්‍යාව කොපමණද;

(iii) එම කිරි ගොවිපොළවලින් වාර්ෂිකව නිෂ්පාදනය කරනු ලබන දියර කිරි ප්‍රමාණය කොපමණද;

(iv) මේ යටතේ ඉදිරියේදී පිහිටුවීමට නියමිත කිරි ගොවිපොළ සංඛ්‍යාව කොපමණද;

(v) මෙම වැඩසටහන සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අඛණ්ඩව ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1127/2024

ගරු ඩී. වීරසිංහ මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) විදුලි ගාස්තු ඉහළ යාම හේතුවෙන් විසිතුරු මත්ස්‍ය අපනයනකරුවන් දැඩි දුෂ්කරතාවයට පත් වී ඇති බව දන්නේද;

(ii) ශ්‍රී ලංකාවේ සිටින විසිතුරු මත්ස්‍ය අපනයනකරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) වර්ෂ 2019 සිට මේ දක්වා විසිතුරු මත්ස්‍යයන් අපනයනය කිරීමෙන් උපයන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) විසිතුරු මත්ස්‍ය කර්මාන්තය ආරක්ෂා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කර ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1154/2024

ගරු නීතිඥ මධුර විතානගේ මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට සිදු කරනු ලබන පුරාවිද්‍යා කැණීම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ස්ථාන කවරේද;

(iii) එම කැණීම්/සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අඛණ්ඩව ලබා දෙන්නේද;

(iv) අවශ්‍ය ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් මේ වනවිට කැණීම්/සංවර්ධන කටයුතු නවතා ඇති පුරාවිද්‍යා ස්ථාන කවරේද;

(v) ඉදිරියේදී කැණීම්/සංවර්ධනය කිරීමට යෝජිත පුරාවිද්‍යා ස්ථාන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වනනෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

**2024 ජූනි 20 බ්‍රහස්පතින්දා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

248/2024

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉහළ යන ජීවන වියදමට සමගාමීව පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් වැඩි කිරීමට ගෙන ඇති පියවර;

(ii) තවමත් එවැනි පියවර ගෙන නොමැති නම් ඊට හේතු;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පවතින ආර්ථික අර්බුදවලදී කාන්තා ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති විශේෂ ක්‍රියාමාර්ග;

(ii) වත්මන් ආර්ථික අර්බුදයට මුහුණ දීම සඳහා කාන්තාවන් ශ්‍රම බලකායට එක්වීමේ ප්‍රවණතාවක් පවතින බැවින්, කාන්තා ශ්‍රමිකයින්ගේ දරුවන්ට ළමා ආරක්ෂණය, පෝෂණය සහ එවැනි සහාය ලබා දීමට ගෙන ඇති ක්‍රියාමාර්ග;

(iii) විදෙස්ගත ගෘහ සේවිකාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ගෙන ඇති පියවර;

(iv) තවමත් එවැනි පියවරක් ගෙන නොමැති නම් ඊට හේතු;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1252/2024

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලෝකයේ බොහෝ රටවල් මේ වනවිට පෞද්ගලික වෛද්‍ය අධ්‍යාපනය ප්‍රවර්ධනය කරනු ලබන බව දන්නේද;

(ii) බටහිර වෛද්‍ය අධ්‍යාපනය ලබා දෙනු ලබන ශ්‍රී ලංකාවේ ඇති පෞද්ගලික වෛද්‍ය අධ්‍යාපන ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) එම ආයතනවල නම් කවරේද;

(iv) ඉහත සඳහන් පෞද්ගලික වෛද්‍ය අධ්‍යාපන ආයතනවල ඉගෙනුම ලබන සිසුන්ට අවශ්‍ය සායනික පුහුණුව සඳහා පවතින රජයේ ශික්ෂණ රෝහල් සංඛ්‍යාව කොපමණද;

(v) එම රෝහල්වල නම් කවරේද;

(vi) ශ්‍රී ලංකාවේ පෞද්ගලික බටහිර වෛද්‍ය අධ්‍යාපනය දියුණු කිරීමට හා ප්‍රවර්ධනය කිරීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1283/2024

ගරු අසංක නවරත්න මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ රජයේ රෝහල්වල මේ වනවිට පවතින මානව සම්පත් හා භෞතික සම්පත් ඌනතාවයන් සම්බන්ධයෙන් සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(ii) එම ඌනතා සපුරාලීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1286/2024

ගරු කිංස් නෙල්සන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතනවල නම් කවරේද;

(iii) වර්ෂ 2018 සිට මේ දක්වා එම එක් එක් පළාත් පාලන ආයතනයේ වාර්ෂික ආදායම හා වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන අතරින් මූල්‍ය හා භෞතික සම්පත් හිඟ පළාත් පාලන ආයතන නගා සිටුවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1701/2024

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නිවාස තුළ සිදු වන ස්වභාවික මරණ ලියාපදිංචි කිරීමේදී, මරණය සිදු වන කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයාගේ හා රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යභාරය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ස්වභාවික මරණයකදී, මරණයට පත් වූ පුද්ගලයාගේ මරණයට හේතුව තහවුරු කර ගනු ලබන නීත්‍යානුකූල ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1703/2024

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල සේවය කරනු ලබන අනධ්‍යයන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ තනතුරු නාම කවරේද;

(iii) නිශ්චිත රාජකාරි ලැයිස්තුවකින් ඔවුන්ට රාජකාරි පවරා දී තිබේද;

(iv) ඉහත සේවකයන් සඳහා උසස්වීම් පටිපාටියක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සේවකයන් අතරින් මේ වනවිට උපාධිය සම්පූර්ණ කර ඇති සේවකයන් සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

(ii) උපාධිය හා පළපුරුද්ද සැලකිල්ලට ගෙන ඔවුන් ගුරුවරුන් ලෙස බඳවාගැනීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1728/2024

ගරු ජගත් ප්‍රියංකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කොට්ඨාස සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම එක් එක් අධ්‍යාපන කොට්ඨාසයේ ඇති ජාතික පාසල් හා පළාත් සභා පාසල් සංඛ්‍යාව සහ ඒවායේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම එක් එක් අධ්‍යාපන කොට්ඨාසයේ පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් විෂයය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම ගුරු පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1738/2024

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු හා නැගෙනහිර පළාත්වල ඇති ඉඩම් මෑතක සිට රජය මඟින් අත්පත් කර ගනු ලබන බවත්;

(ii) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඉරක්කක්කණ්ඩි, පුල්මුඩේ, කින්නියා, මුතූර් සහ තෝප්පූර් යන ප්‍රදේශවල ඉඩම්, ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ඒවායේ හිමිකරුවන්ගේ අවසරයකින් තොරව මැනුම් කටයුතු සිදු කරනු ලබන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත මැනුම් කටයුතු සිදු කිරීමට හේතුව කවරේද;

(ii) ඉහත සඳහන් පරිදි ඉඩම් අත්පත් කර ගැනීම, එම ඉඩම්වල පාරම්පරිකව කෘෂිකර්මික කටයුතු සිදු කරනු ලබන ගොවීන්ගේ ජීවනෝපායට අහිතකර ලෙස බලපාන බව දන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1750/2024

ගරු ඉෂාක් රහුමාන් මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම සුළං විදුලි බලාගාරයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම බලාගාරය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු කරන ලද මුදල කොපමණද;

(iii) එම බලාගාරයෙන් ජාතික ජාලයට එකතු කිරීමට අපේක්ෂා කරනු ලබන විදුලි ප්‍රමාණය මෙගා වොට්වලින් කොපමණද;

(iv) එම විදුලි බලාගාරයේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට අපේක්ෂා කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද;

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1877/2024

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොරගහකන්ද ව්‍යාපෘතිය හේතුවෙන් මාතලේ දිස්ත්‍රික්කයේ, එම ව්‍යාපෘතිය අවට පිහිටා ඇති ගම් රැසක ජනතාව වනඅලි තර්ජනයට මුහුණ දී සිටින බව දන්නේද;

(ii) එම ගම්මානවල නම් කවරේද;

(iii) එම ගම්මානවල ජීවත් වන මේ වනවිට වනඅලි තර්ජනයට මුහුණ දී සිටින පවුල් සංඛ්‍යාව එක් එක් ගම්මානය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම වනඅලි තර්ජනය විසඳීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?